18 FEB
10-2-1992

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 674/5 — 1991 අගෝස්තු 05 වැනි සඳුදා — 1991.08.05

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස — පළාත් සභා

## පළාත් සභා නිවේදන

1990.08.09 වැනි දින මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලදී.

### මධ්‍යම පළාතේ 1990 අංක 06 දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේ නව වන උපලේඛනයේ පළමු වන ලැයිස්තුවේ II වැනි වගන්තියේ (I, II, III, IV, V) අනුව සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම පිණිසත්, එයට සම්බන්ධ වූ හෝ අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන යෙදීම පිණිසත් වූ ප්‍රඥප්තියකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

(1) මේ ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 06 දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ නියමයක් මගින්, නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේය. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය)*

(2) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සහ වෛද්‍ය මණ්ඩල සඳහා ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරිවරුන්, වෙනත් නිලධාරින් සහ සේවකයින් කාලයෙන් කාලයට පත් කළ හැකි වන්නේය. *(සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)*

(3) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ලෙසට කටයුතු කරනු ලබන හෝ කටයුතු කරනු ලැබිය හැකි හෝ තැනැත්තෙක් සහ සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සෞඛ්‍ය සේවා සහකාර අධ්‍යක්ෂවරුන් ලෙසට කටයුතු කරනු ලබන හෝ කටයුතු කරනු ලැබිය හැකි තැනැත්තන් පත් කළ යුතු වන්නේය. *(තනතුරුවලට පත් කිරීම.)*

(4) මෙයින්, මින්මතුවට මේ ප්‍රඥප්තිය මගින් කරනු ලබන නියමයන් සහ විධිවිධානයන්ට අනුකූල වන ලෙසට, එම නියමයන්ට සහ විධිවිධානයන්ට යටත්ව, අමාත්‍යවරයා විසින් අමාත්‍ය වරයාගේ පොදු පාලනයට සහ විධානයන්ට අනුකූල වන ලෙසට දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ සේවකයන් සම්බන්ධයෙන් රෙගුලාසි පැනවිය යුත්තේය. *(නිලධාරින්ගේ බලතල සහ රාජකාරී)*

රෙගුලාසි

(5) (1) අමාත්‍යවරයාට ප්‍රඥප්තිය මගින් දෙනු ලැබ ඇත්තාවූ විධිවිධානයන්ට සහ මූලධර්මයන්ට අනුකූල වනසේ රෙගුලාසි පැනවිය හැකි වන්නේය.

(2) උපවගන්ති I, II, III, IV, V මගින් අමාත්‍යවරයා වෙත ලබා දී ඇති බලතලවලට අනුකූල වන ආකාරයටත්, හානියක් නොවන ආකාරයටත්, විශේෂයෙන් අමාත්‍යවරයාට පහත කාරණා සියල්ල සම්බන්ධයෙන් හෝ එක් එක් කාරණාවක් සම්බන්ධයෙන් හෝ රෙගුලාසි පැනවිය හැකි වන්නේය:—

(අ) (ශික්ෂණ රෝහල් හා විශේෂ කාර්යය සඳහා පිහිටුවනු ලබන රෝහල් හැර) මහජන රෝහල්, ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාස හා බෙහෙත් ශාලා පිහිටුවා පවත්වාගෙන යාම,

(ආ) මහජන සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, පවුල් සෞඛ්‍ය, මාතෘ දාරකා රක්ෂණය, ආහාර හා ආහාර සෞඛ්‍ය රක්ෂණය, පාරිසරික සෞඛ්‍යය,

(ඇ) පළාත සඳහා සෞඛ්‍ය වර්ධන සැලසුම සහ වාර්ෂික සෞඛ්‍ය සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම,

(ඈ) ඖෂධ ලබාදීම හැර, පළාත ඇතුළත ඉහත "අ" හි සඳහන් සියළු ආයතන සඳහා පහසුකම් සැලසීම,

(ඉ) ඉහත 'අ' හි සඳහන් ආයතනවලට අනුයුක්ත පිරිස් වලට ශ්‍රී ලංකාව ඇතුළත පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන සියළුම රෙගුලාසි පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම, පළාත් සභාවේ අනුමැතිය ලැබුණායින් පසු පමණක් ක්‍රියාත්මක විය යුතුය.

(6) පද සම්බන්ධයෙන් අනයාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ ප්‍රඥප්තියෙහි, "අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ සෞඛ්‍ය සේවා විෂයය භාරව කටයුතු කරනු ලබන හෝ කටයුතු කිරීමට පත් කරනු ලබන තැනැත්තෙකු අදහස් වන්නේය.

"අධ්‍යක්ෂ" යන්නෙන් මධ්‍යම පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා අදහස් වන්නේය.

8-853